# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායසය , බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2010/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/07/2024<br>පැය 1430 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.07.22 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 04 | 41 | 472 | තඹ දඟර 02<br>යකඩ බැරල් 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය II**

2024.07.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය II කණ්ඩායමක් විසින් හොරණ පොලිස් වසමේ කරගහදෙනිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 10 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ මූණගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.07.22 වන දින සවස කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කඩවත පොලිස් වසමේ වැබඩ

ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර මත් කරල් 230 ක් සහ ජංගම දුරකතනයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කඩවත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 44 **ක් වූ** වැබඩ **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු ප්‍රවහනය කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුර.**

2024.07.22 වන දින රාත්‍රි කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ හවාඑලිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු බෝතල් 90 ක් සන්තකයේ තබාගෙන කැබ් රථයකින් ප්‍රවාහනය කල සැකකරුවෙකු කැබ් රථයත් අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වූ හවාඑලිය ප්‍රදේශයේ පදිංචිකාරුවෙකු වේ.** පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුර**

2024.07.22 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්පාර කඳවුරේ නිලධාරින් විසින් දමන පොලිස් වසමේ පන්නලගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දමන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 34 **ක් වූ පන්නලගම ප්‍රදේශයේ පදිංචිකරවෙකි.** හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර**

2024.07.22 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුරේ නිලධාරින් විසින් මාන්කුලම පොලිස් වසමේ 09 කණුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 101 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාන්කුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 25 **ක් වූ** මල්ලාවි **ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම් කඳවුර**

2024.07.22 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අනුරාධපුර පොලිස් වසමේ විජයපුර

ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05යි මිලි ග්‍රෑම් 140 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ විජයපුර ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**08. බලපත්‍ර නොමැතිව වැලි පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර**

2024.07.22 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිත්ගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ නෙළුඹය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් වැලි පටවමින් සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන හොරොව්පතාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ සුහදගම ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** හොරොව්පතාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**09. බලපත්‍ර නොමැතිව වැලි පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කැබිතිගොල්ලෑව කඳවුර**

2024.07.22 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කැබිත්ගොල්ලෑව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හොරොව්පතාන පොලිස් වසමේ නෙළුඹය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කර වැලි පටවමින් සිටි සැකකරුවෙකු ට්‍රැක්ටර් රථයක් සමඟ අත්අඩංගුවට ගෙන හොරොව්පතාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ සුහදගම ප්‍රදේශයේ පදිංචිකාරුවෙකි.** හොරොව්පතාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**